**මාතලේ ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාතලේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මාතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල අතිකාල හා ජල ව්‍යාපෘති සේවක දීමනා එකතුව රු.48,366 ක් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරිමට කටයුතු කර ඇති බව. | වර්ෂයේ වියදම නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ආ ) | කුලියට ගත් කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය වෙනුවෙන් ගෙවියයුතු රු.30,000 ක් ගිණුම්ගත කර නොතිබුණි . | -එම- | -එම - |
| (ඇ) | රු.40,000 ක් වටිනා වපසරිය පර්චස් 10 ක් වූ ඉඩමක් දෙවරක් ගිණුම්වල සටහන් කර තිබුණි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරිමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කල යුතුය. |

### 1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් 04ක ඔප්පුවේ සඳහන් වටිනාකම් හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් අතර රු.2,951,524 ක නොසැසඳීම් පැවතුණි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරිමට කටයුතු කර ඇති බව | වටිනාකම නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කලයුතුය. |
| (ආ) | තැන්පත් ගිණුම් සාරාංශය (උපලේඛණ) අනුව විවිධ තැන්පත් ශේෂය රු.14,577,968 ක් වුවද ශේෂ පත්‍රයේ එය රු.14,877,511 ක් ලෙස දක්වා තිබීමෙන් රු.299,543 ක වෙනසක් පැවතුණි. | -එම- | -එම - |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 254,500 ක වත්කම් විෂයක හා රු.22,100 ක බැරකම් විෂයකට අදාල උප ලේඛන හා ශේෂ සනාථ කිරීමේ ලිපි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15(3) (ඇ) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු කාර්ය සාධන වාර්තාවෙහි ප්‍රාදේශීය සභාව ඉටුකර ගත් අරමුණු , අනාගත අපේක්ෂා , ප්‍රධාන කාර්යසාධන දර්ශක හා සම්පත් භාවිතා කිරීම සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කර නොතිබුණි . | කාර්යය සාධන වාර්තාව වඩාත් ඵලදායී හා ඉලක්කගත කාර්ය සාධන වාර්තාවක් ලෙස යොදා ගැනිමට ඉදිරියේදී කටයුතු සිදු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත වගන්තිය 127 | සුසාන භූමි 13 ක් හඳුනාගෙන තිබුණු අතර, වැට මායිම සලකුණු කර එහි ආරක්ෂාව තහවුරු කර නොතිබුණි. අනෙකුත් සුසාන භූමි තක්සේරු කර ස්ථාවර වත්කම් යටතට ගැනීමට කටයුතු කර නොතිබුණි. | සුසාන භූමිවල වටිනා කම් තක්සේරු කර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව | ගිණුම්ගතකර ආරක්ෂාව තහවුරු කල යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත්, පළාත් | එක්වන් මුදල සම්පූර්ණයෙන් ගෙවූ පසු, කඩ කාමරය | මේ වන විට සියලුම කඩ කාමර සඳහා බදු ගිවිසුම් විධිමත් පරිදි | චක්‍රලේඛ උපදෙස් අනුව එක්වන් මුදල අයකර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | පාලන කොමසාරිස් චක්‍රලේඛයේ IV වන වගන්තිය | බදුදීමට අදාළ බදු ගිවිසුම අත්සන් කළයුතු වුවත්, පලාපත්වල පොදු වෙළඳපොල අංක 04 හා 06 කඩ කාමර දෙක බදු ලබා දීමේදී එක්වන් මුදල හා ඒ සඳහා පොළි ලෙස පැවති මුදල වූ රු.298,900 ක මුදල අයකිරීමකින් තොරව බදු ගැණුම්කරුවන් සමඟ ගිවිසුම්ගතව තිබුණි. | දෙපාර්ශවයන් විසින් අත්සන් කර සුරක්ෂිතව තබා ගෙන ඇති බව | |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | සභාව සතු ධාවන තත්ත්වයේ පවතින වාහන 07 ක් සම්බන්ධව ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාව නියමිත කාලය තුල සිදු කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 58,303,615 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.55, 243,576 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,349,000 | 1,167,566 | 1,345,721 | 560,127 | 6,151,000 | 5,595,133 | 5,462,926 | 887,245 |
| (ii) | කඩ කුලී | 250,000 | 334,775 | 327,320 | 15,390 | 1,980,000 | 432,980 | 445,985 | 8,200 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,200,000 | 980,996 | 978,996 | 2,000 | 2,725,000 | 1,692,088 | 1,692,088 | - |
| (iv) | වෙනත් ආදායම් ජල | 100,322,500 | 99,193,523 | 99,619,998 | 59,349,854 | 89,163,000 | 78,734,995 | 54,173,708 | 59,859,207 |
| | එකතුව | 103,121,500- | 101,676,860 | 102,272,035 | 59,927,371 | 100,019,000 | 86,455,196 | 61,774,707 | 60,754,652 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| | එක් ඒකකයකින් රු.1,000 කට වඩා වැඩි හිඟ හිටි දේපල 126 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.220,858 ක වරිපනම් ශේෂයක් අයකරගෙන නොතිබුණි. | දේපළ තහනමක් සිදු කර වරිපනම් බදු අයකර බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | වෙනත් ආදායම් | | |
| | සභාවට අයත් අක්‍රීය තත්ත්වයේ පවතින ජල යෝජනා ක්‍රම 05 ක ජල පාරිභෝගිකයින් 344 ගෙන් වසර 6 ත් 11 ත් අතර කාලයක සිට හිඟ හිටි රු.1,150,768 ක් විය. | අයකරගැනීමට නොහැකි ජල යෝජනා ක්‍රමවල පවතින හිඟ ජල ගාස්තු කපා හැරීමට කටයුතු කරන බව | හිඟ ගාස්තු අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 3 ක එකතුව රු.4,607,917 ක් විය. | දීර්ඝ කාලීන හිඟ ශේෂ කපා හැරීමට හා අනෙකුත් ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.31,313,412 ක් විය. | අමාත්‍යාංශයේ රඳවා ඇති මුදල් ඉදිරියේ ලබා ගෙන කොන්ත්‍රාත් සමිතියට ගෙවීම් කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.2,433,600 ක ඉඩම් 07ක් අයිතිය පවරාගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව | ඉඩම් වල අයිතිය පවරා ගත යුතුය. |
| (ඈ) | විසල් මාතලේ ජල ව්‍යාපෘතියේ මාර්ග පළුදු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමේ පරිපාලන වියදම් සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ලැබී තිබූ මුදලින්, කිසිදු රාජකාරියක් හෝ අධීක්ෂණයක් කල බවට සාක්ෂි ඉදිරිපත් කිරීමකින් හා අනුමැතියකින් තොරව සභාපති හා තවත් නිළධාරින් දෙදෙනකුට රු.2,215,053 ක් ගෙවා තිබුණි. | ගෙවීම් සම්බන්ධ තොරතුරු ගොනුවේ හා ලේඛන වලින් තහවුරු කරගත හැකි බව. | මෙම ජල ව්‍යාපෘතිය අධීක්ෂණය කළ බවට පැහැදිළි හා විධිමත් ලේඛන ඉදිරිපත් කළයුතුය. |

## 3.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බලප්‍රදේශය තුළ ඇති සුසාන භූමි ප්‍රමාණය කොපමණද යන්න තහවුරු කර ගැනීම සඳහා විධිමත් සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර දැනට භූමදාන කටයුතු හා ආදාහන කටයුතු සඳහා භාවිතා කරනු ලබන සුසාන භූමි 13ක අයිතිය පවරාගෙන නොතිබුණි. | සභාවට අයිති සුසාන භූමි හඳුනා ගෙන අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 11 ක පුරප්පාඩු 23 ක් ද තනතුරු 07 ක අතිරික්තතා 22 ක් ද පැවතුණි. | සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා ස්ථිර පදනමින් සේවකයින් බඳවා ගැනීමට ඉල්ලීම් කර ඇත. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී පැමිණි, ස්ථාන මාරුවී ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් වසර 2 සිට වසර 3½ ක කාලයක් ගතවී ඇති ණය ශේෂ එකතුව රු.1,855,451 ක ණය ශේෂ නිරවුල් කර නොතිබුණි. එසේම එම නිලධාරීන්ගෙන් අයකර ගන්නා ලද එකතුව රු.715,278 ක වාරික මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | ණය ශේෂ නිරවුල් කර ගිණුම් නිරවුල් කිරිමට කටයුතු කරන බව | හිඟ ණය ශේෂය නිරවුල් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී වැය විෂයයන් 56 ක සියයට 57 සිට සියයට 100 දක්වා ද ආදායම් විෂයයන් 32 ක සියයට 49 සිට සියයට සියය ඉක්මවූ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලක කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල රටේ පැවති වසංගත තත්ත්වය මත ආදායම් ඉලක්ක සපුරා ගැනිමේ යම් යම් බාධාවන් හා වියදම් සීමා පැවැති බව. | ආදායම් හා වියදම් නිවැරදිව පුරෝකථනය කර අයවැය පිළියෙල කළ යුතුය. |